JMC vLearning
"your virtual learning partner"

# LKAS 37 : ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ වත්කම් - පුනරීක්ෂණ

## AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය


සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# LKAS 37 - වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්



JMC vLearning "your virtual learning partner"

# 2018 ජූලි ප්‍රශ්න අංක 07 (b)

(b)2018 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා **XYZ සමාගමේ** පහත තොරතුරු ලබාදී ඇත.

(1) අස්තිත්වය වගකීම් සහතිකයක් සහිතව භාණ්ඩ විකුණනු ලබයි. එම වගකීම් සහතිකය මඟින් භාණ්ඩ මිලදී ගෙන පළමුවන මාස හය ඇතුලත සිදුවන නිෂ්පාදන දෝෂ වෙනුවෙන් සිදු කරනු ලබන නඩත්තු කිරීම් සඳහා දරනු ලබන පිරිවැය ආවරණය කරනු ලබයි. අස්තිත්වයේ අතීත අත්දැකීම් අනුව විකුණුම්වලින් 2% ක ප්‍රමාණයක් වගකීම් සහතික මත නඩත්තු පිරිවැය ලෙස දැරීමට සිදුවන අතර, 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රු. මිලියන 30 ක විකුණුම් වාර්තාගත වී ඇත. වර්ෂය පුරා විකුණුම් සමාන ලෙස සිදු වී ඇති බව උපකල්පනය කරන්න.



JMC vLearning
"your virtual learning partner"

# 2018 ජූලි ප්‍රශ්න අංක 07 (b)

(2) 2015/16 තක්සේරු වර්ෂයට අදාලව දැරූ වියදම්වල ඉඩ නොදුන් කොටසක් සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රු. මිලියන 2.5 ක ආදායම් බදු තක්සේරුවක් එවා තිබුණි. පිළිතුරු ලිපි කිහිපයක් සහ වියදමට සම්බන්ධ ලියකියවිලි යැවීමෙන් පසු අවසන් ඇස්තමේන්තුවල ලෙස රු. මිලියන 2 ක් බදු අභියාචනා කොමිෂන් සභාව විසින් 2018 මාර්තු 30 දින නියම කරන ලදි. මෙය මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කර නොතිබුණි.

# 2018 ජූලි ප්‍රශ්න අංක 07 (b)

(3) 2018 මාර්තු 25 සේවකයෙකු විසින් කරන ලද වංචාවකට සමාගම විසින් එම සේවකයා සේවයෙන් පහකරන ලද අතර, සේවකයා එකී සිද්ධියට, සමාගමට එරෙහිව නඩුවක් පවරා ඇත. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අනුමත කළ දිනය දක්වා සමාගමේ නීතිඥයන්ගේ උපදේශය වූයේ මෙකී සිද්ධියට අදාලව සමාගම වෙත වගකීමක් ඇතිවීමේ හැකියාවක් නොමැති බවයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

LKAS 37 - ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම්, සහ අසම්භව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත සඳහන් එක් එක් අවස්ථාව හඳුනාගත යුතු ආකාරය **පැහැදිලි කරන්න.** (ලකුණු 06)



# 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (b)

2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත ගිත්මි සමාගමට** අදාලව පහත සඳහන් තොරතුරු ද සපයා ඇත.

(a) 2017/18 තක්සේරු වර්ෂය සඳහා සමාගම විසින් ආනයනයේදි ගෙවනු ලැබූ යෙදවුම් බද්දෙන් රු. මිලියන 1.5 ක් ඉඩ නොදෙමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ විසින් එකතුකල අගය මත බද්ද (Value Added Tax (VAT)) සඳහා තක්සේරුවක් එවා තිබේ. මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා බොහොමයක් පැවති අතර, රු. මිලියන 1 ක් ඉඩ නොදිමේ අවසන් තීරණය 2019 අප්‍රේල් 02 වන දින ලැබී තිබුණි. මෙය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදි සැළකිල්ලට ගෙන නොතිබුණි.



JMC vLearning "your virtual learning partner"

## 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (b)

(b) **සීමාසහිත ගින්මී සමාගම** විසින් පල කරන ලද වෙළඳ දැන්වීමක් මඟින් තරඟකරුවෙකුගේ නිෂ්පාදිතයකට අපහාස වූ බව සඳහන් කරමින් සමාගමේ තරඟකරුවෙක් විසින් සමාගමට විරුද්ධව නඩුවක් පවරා තිබේ. ඉල්ලා ඇති වන්දි මුදල රු. මිලියන 50 ක් වන අතර, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීමේ දිනය දක්වා (එනම් 2019 මැයි 15) සමාගම වෙත මේ සම්බන්ධයෙන් වගකීමක් නොමැති බව සමාගමේ නීතිඥයන් විසින් උපදෙස් දී තිබේ



## 2020 ජනවාරි ප්‍රශ්න අංක 07 (b)

**ඔබ විසින් කළ යුතු දෑ:**

LKAS 37 ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් ප්‍රමිතියට අනුව, 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඉහත සඳහන් එක් එක් අවස්ථාව හඳුනාගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 05)



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 05

(a) පහත සඳහන් තොරතුරු පාරිභෝගික විදුලි භාණ්ඩ නිපදවන **සීමාසහිත බෙස්ට් ටෙක් සමාගමේ** 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

(1) මූල්‍ය වර්ෂය තුළදී, සමාගමේ පාරිභෝගිකයෙකු සමාගමේ භාණ්ඩවල බාල ගුණාත්මකභාවය හේතුවෙන් රු. මිලියන 10 ක වන්දියක් ඉල්ලා සමාගමට එරෙහිව නඩු පවරා ඇත. සමාගමට, අදාල පාරිභෝගිකයාට වන්දි මුදලක් ගෙවීමට සිදුවීමේ වැඩි සම්භාවිතාවයක් පවතින බව සමාගමේ නීතිවේදින් විසින් විශ්වාස කරන නමුත් අදාල වන්දි මුදලේ ප්‍රමාණය පිළිබඳව ඔවුන් අවිනිශ්චිත තත්ත්වයක සිටී.



# 2021 ජනවාරි ප්‍රශ්න අංක 05

(2) මිලදී ගැනීමෙන් පසු ඇතිවන නිෂ්පාදන දෝෂ සඳහා මාස 6 ක වගකීමක් සහිතව සමාගම සිය නිෂ්පාදන අලෙවි කරයි. අතීත අත්දැකීම්වලට අනුව සමාගම පෙන්වා දෙන්නේ විකුණන ලද භාණ්ඩ වලින් 70% කට කිසිදු දෝෂයක් හට නොගන්නා බවත්, විකුණන ලද භාණ්ඩවලින් 25% ක සුළු දෝෂ පවතින බවත්, විකුණන ලද භාණ්ඩවලින් 5% කට විශාල අළුත්වැඩියාවක් අවශ්‍ය වන බවත්ය. සියළුම නිෂ්පාදිතවල සුළු දෝෂයන් හඳුනාගතහොත් අළුත්වැඩියා කිරීමේ පිරිවැය රු. 1,200,000/- ක් වන අතර, සියළුම නිෂ්පාදිතවල විශාල අළුත්වැඩියාවක් අවශ්‍ය වුවහොත් ඒ සඳහා අළුත්වැඩියා කිරීමේ පිරිවැය රු. 4,800,000/- ක් වේ.



JMC vLearning "your virtual learning partner"

# 2021 ජනවාරි ප්‍රශ්න අංක 05

**ඔබ විසින් කළ යුතු දෑ:**

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 37 වෙන්කිරීම්, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් ප්‍රමිතයට අනුව ඉහත එක් එක් අවස්ථාවක් 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත බෙස්ට් ටෙක් සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල කෙසේ හඳුනාගත යුතු ද යන්න පැහැදිලි කරන්න.** (ලකුණු 05)





JMC vLearning "your virtual learning partner"